# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1519/26 – 2007 ඔක්තෝබර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2007.10.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරුක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2007 පෙබරවාරි මස 02 වන දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමය, මගින් අවසන් වරට (සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සළකනු ලැබිය යුතු සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වන තිරයේ දැක්වෙන "පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයෙහි II වන තීරයේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ :-

"5. පශු ප්‍රජා සෞඛ්‍ය සහ භිෂග්වේද අධ්‍යයන අංශය.".

මහාචාර්ය වටරුක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11– 154

1A—G 008994— 1930 (2007/10)